# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

| 11 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | 3 ඒකකය |
|---|---|---|

## බුදුකුරු දම් පුරා - දිවිමග ගනිමු සපුරා

## I කොටස

**01. නිවැරදි පිළිතුර ලකුණු කරන්න.**

1. පාරමිතා හඳුන්වන තවත් නමක් වනුයේ,
   i. දස කුසල්
   ii. දස පුණ්‍යක්‍රියා
   iii. කසිණ ධර්ම
   iv. බුද්ධකාරක ධර්ම

2. ත්‍රිවිධ බෝධිය නිවැරදි වර්ණය වන්නේ,
   i. ශාරීරික, පාරිභෝගික, උද්දේශික
   ii. පාරමී, උපපාරමී, පරමත්ථ පාරමී
   iii. සම්මා සම්බුද්ධ, පච්චේක බුද්ධ, අරහන්ත බුද්ධ
   iv. භෝග, උපභෝග, පාරිභෝග

3. පාරමිතාවක් තුන් ආකාරයකින් පූරණය කරන්නේ,
   i. පච්චේක බුද්ධත්වය පතන උතුමෝ
   ii. අරහන්ත බුද්ධත්වය පතන උතුමෝ
   iii. සෝවාන් තත්වය පතන උතුමෝ
   iv. සම්මා සම්බුද්ධත්වය පතන උතුමෝ

4. පාරමිතා ධර්ම සංඛ්‍යාත්මකව නිවැරදි වන්නේ,
   i. 15 කි
   ii. 14 කි
   iii. 10 කි
   iv. 11 කි

5. සිදුහත් බෝසතාණන් වහන්සේගේ දාන පාරමිතාව සඳහා ප්‍රගුණ කළ ජාතක කතාවකි
   i. වණ්ණුපථ ජාතකය
   ii. වෙස්සන්තර ජාතකය
   iii. සීල විමංස ජාතකය
   iv. උම්මග්ග ජාතකය

6. ඉවසීම ප්‍රගුණ කරන පාරමිතාව හඳුන්වන්නේ,
   i. නෙක්ඛම්ම පාරමිතාව
   ii. සස ජාතකය
   iii. ඛන්ති පාරමිතාව
   iv. විධුර ජාතකය

7. සම්මා සම්බුද්ධත්වය සඳහා පාරමිතා ධර්ම ත්‍රිවිධාකාර වේ. එම පාරමිතා සංඛ්‍යාව වනුයේ,
   i. 40 කි
   ii. 30 කි
   iii. 40 කි
   iv. 20 කි

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

8. දාන උපපාරමිතා මගින් පූරණය කරන්නේ,
   i. තම ජීවිතයම දන් දී පාරමිතා වැඩීමයි
   ii. තම භෞතික වස්තූන් දන් දී පාරමිතා වැඩීමයි
   iii. තම මිළ මුදල් දන් දී පාරමිතා වැඩීමයි
   iv. තම ශරීර අංග ප්‍රත්‍යංග දන් දී පාරමිතා වැඩීමයි

9. පාරමිතාවක් එක් ආකාරයෙන් පමණක් පූරණය කරනු ලබන්නේ,
   i. රහත් බෝධි සඳහා
   ii. පසේ බුද්ධත්වය සඳහා
   iii. සෝවාන් මාර්ගය සඳහා
   iv. සෝවාන් ඵලය සඳහා

10. පාරමිතා පුහුණු කරන්නෙක් තුළ තිබිය යුතු කරුණු සංඛ්‍යාත්මකව කොපමණද?
   i. 04 කි   ii. 05 කි   iii. 06 කි   iv. 10 කි

## II කොටස

- **සියළු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

02. 1. පාරමිතා යන්නෙහි අර්ථය ලියන්න.
   2. ''දානං සීලංච නෙක්ඛම්මං...'' ගාථාව සම්පූර්ණ කරන්න.
   3. පාරමිතා ධර්ම හඳුන්වන තවත් නමක් සඳහන් කරන්න.
   4. පාරමිතා ධර්ම ප්‍රගුණ කරන්නෙක් තුළ ඇති කරගත යුතු කරුණු 05 නම් කරන්න.
   5. දාන පාරමිතාව සඳහා උදාහරණ ජාතක කථා දෙකක් නම් කරන්න.
   6. ප්‍රඥාව ඇති කරගත හැකි ක්‍රම තුන සඳහන් කරන්න.
   7. යමක් ආරම්භ කර පවත්වාගෙන යාමේදී ඇති කරගත යුතු වීර්යයේ ප්‍රභේද තුනකි. සඳහන් කරන්න.
   8. මහා කපි ජාතකයෙන් බෝසතාණන් වහන්සේගේ කිනම් පාරමිතා පිරීමේ ගුණය පිළිබිඹු වේද?
   9. සීල යනු කුමන සංවරභාවයක්ද?
   10. ජාතක පොත් වහන්සේ තුළ සංඛ්‍යාත්මකව පාරමිතා කොපමණද?

03. 1. බෝසතාණන් වහන්සේ පූරණය කළ ඛන්ති පාරමිතාව සඳහා ජාතක කථාවක් සඳහන් කරන්න.
   2. ඔබට සමාජයේදී ඉවසීමට සිදු වූ අවස්ථා දෙකක් සඳහන් කරන්න.
   3. ඉවසීම පාරමිතාවක් ලෙස පුහුණු කිරීමෙන් සමාජයට සිදුවන යහපත පිළිබඳ පැහැදිලි කරන්න.

04. 1. බෞද්ධයන්ට සීලය ආරක්ෂා කිරීමට ඇති සීලවර්ග තුනක් සඳහන් කරන්න.
   2. සීල පාරමිතාව තුන් ආකාරයකට අනුව බෙදා සඳහන් කරන්න.
   3. පාරමිතා ධර්ම ආරක්ෂා කිරීමෙන් සමාජයේ සාරධර්ම ආරක්ෂාවන ආකාරය පැහැදිලි කරන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!